රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2014 (I)

මගේ අංකය :- EST-2/POLCY/03/0798-I
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2014.09.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014හි 02 ඡේදයේ II උප ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම අත්කර ගැනීමට ලබා දී ඇති සහන කාලය තුළ අදාළ නිලධරයන්ට ඉහත චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් නව විධිවිධානයන්ට අදාළ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට ප්‍රමාණවත් අවස්ථාවක් නොලැබුණු හෙයින් ඒ සඳහා 2016.06.30 දක්වා සහන කාලයක් ලබා දීමට 2014.08.07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත. එකී සහන කාලය පිළිබඳව අදාළ නිලධරයන් දැනුවත් කරන මෙන් මෙයින් දන්වා සිටිමි.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය